සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

12 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

ශෛවනෙරි I, II
சைவநெறி I, II
Saivaneri I, II

## ශෛවනෙරි II

* **පළමුවන** ප්‍රශ්නය හා **දෙවන** ප්‍රශ්නය ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20**ක් ද, දෙවන ප්‍රශ්නයට ලකුණු **16**ක් ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු **8** බැගින් ද හිමිවේ.

**1.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) 'කඩවුල්' යන වචනයේ අර්ථය කුමක් ද?

(ii) දෙවියන්ගේ ගුණාංග අටෙන් (එන්කුණම්) **දෙකක්** සඳහන් කරන්න.

(iii) 'විප්‍රනායනාර්'යනුවෙන් හඳුන්වනු ලැබුයේ කවුරුන් ද?

(iv) චෝල රජු කාලයේ තිරුකෝණේශ්වරම් හඳුන්වනු ලැබුයේ කුමන නමකින් ද?

(v) ශ්‍රී ලංකාවේ පිහිටි තිරුප්පඩයි දේවාල **දෙකක්** නම් කරන්න.

(vi) 'මාදෝට්ටම්' යනුවෙන් හඳුන්වනු ලබන දේවාලය කුමක් ද?

(vii) පියවරුන් මිය ගිය අය විසින් කරනු ලබන උපවාසය කුමක් ද?

(viii) තයිපූසම් දිනය විශේෂ දිනයක් ලෙස සලකා කරනු ලබන සුභ ක්‍රියා **දෙකක්** ලියන්න.

(ix) "ඔරු පොරුලුම් කාට්ටා(දු) ඉරුලුරුවං කාට්ටුම්
ඉරු පොරුලුම් කාට්ටා(දු) ඉදු"
මෙහි 'ඉදු' යනුවෙන් සඳහන් කෙරෙන්නේ කුමක් ද?

(x) ශෛව ආගමේ විශේෂ ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

**2.** (i) පහත සඳහන් ගීතිකා **දෙකක්** නිවැරදිව හා නියම අනුපිළිවෙළට ලියන්න.

(ii) ඒවායේ තේරුම ලියන්න.

(අ) "ආලන් තානුගන් දමුදුසෙයි... "

(ආ) "මාරිනින් රෙන්නයි... "

(ඉ) "ආත්තාලයි යෙංග ලහිරාම... "

(ඊ) "උලගෙ ලාමුණර්න් දෝදට්..."

(උ) "විනායගනේ වෙව්විනයයි... "

WWW.OLEVELAPI.COM

**3.** "ශ්‍රී ලංකා ඉතිහාසයේ පොළොන්නරු යුගයේ ශෛව ආගම උසස් ස්ථානයක තිබිණි."

(i) චෝල රජ සමයේ පොළොන්නරුව හඳුන්වනු ලැබුයේ කුමන නමකින් ද?

(ii) චෝල යුගයේ, නන්දි රූව සඳහන් වූ මුද්‍රාව සොයාගනු ලැබූ ශ්‍රී ලංකාවේ ශිව දේවාලයේ නම කුමක් ද? එම දේවාලය පිහිටා ඇත්තේ කොහේ ද?

(iii) පොළොන්නරු යුගයේ සුවිශේෂත්වය ලැබ තිබූ ශිව දේවාල **දෙකක්** සම්බන්ධ ව කෙටියෙන් විස්තර කරන්න.

**4.** "ඥාන මාර්ගය වර්ධනය කළේ සන්ධාන කුරවර්ලා ය."

(i) පූර සන්ධාන කුරවල්ලා **හතර දෙනකුගේ** නම් සඳහන් කරන්න.

(ii) සිත්තාන්ද සාත්‍ර ග්‍රන්ථ කීයක් වේ ද? ඒවායින් අරුණන්දි සිවාචාරියර් රචනා කළ ග්‍රන්ථ **දෙක** මොනවා ද?

(iii) සිත්තාන්ද ශාස්ත්‍ර ග්‍රන්ථවලින් විශිෂ්ටතම ග්‍රන්ථය වූ ශිවඥානපෝදම් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

[හයවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

5. "තිරුවාසගත්තිට්කු උරුගාදාර් ඔරු වාසගත්තිට්කුම් උරුගාර්."
   (i) තිරුවාසගම්වල ගීතිකා කීයක් වේ ද? ඒවා රචනා කළේ කවුරුන් ද?
   (ii) තිරුවාසගම් ලියන ලද පුස්කොළ පොත්වල අවසානයෙහි දෙවියන්ගේ අත්සන යොදා ඇත්තේ කෙසේ ද?
   (iii) ශෛව ආගමිකයන් තම ජීවිතයෙහි දී තිරුවාසගම් ගායනා කරන විශේෂ අවස්ථා **තුනක්** සඳහන් කරන්න.

6. "එලිය නල් තීබම් ඉඩල් මලර් කොයිදල්
   අලියින් මෙලුහල් අදුතුර්තල් වාල්ත්තල්
   පලිපණි පට්‍රල් පන්මංජනම් ආදි
   තලි තොලිල් සෙයිවදු තාන් තාස මාර්ක්කමේ" - තිරුමන්දිරම්
   (i) සරියෛ පිළිපදින්නන් ලබන මාර්ගය හා විමුක්තිය සඳහන් කරන්න.
   (ii) සරියෛ මාර්ගය පිළිපදින ලද නායන්මාර්වරුන් **තිදෙනකු** නම් කරන්න.
   (iii) ශාරීරික සේවා (සරියෛ තොණ්ඩුහල්) පිළිබඳ ව කෙටියෙන් පැහැදිලි කරන්න.

7. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන, කෙටි සටහන් ලියන්න.
   (i) සුන්දර්මූර්ති නායනාර්තුමාගේ සමාජ සේවා
   (ii) අප්‍රේල් අවුරුදු උදාව (සිත්තිරෛ වරුඩපිරප්පු)
   (iii) ශෛව විද්‍යා විරුත්ති සංගම්
   (iv) ශෛව ආගමික ජීවිතයේ මිනිස්කම
   (v) මාමාංග පිල්ලෛයාර් දේවාලය

***

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...